**සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල - 2021**

------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2 හි 54 ඡේදය ප්‍රකාරව මුදල් හෝ මුදල් හා සමාන දෑ යොදා ගැනීම අවශ්‍ය නොවන ආයෝජන හා මූල්‍ය ගණුදෙනු මුදල් ප්‍රවාහ ප්‍රකාශනයකින් ඉවත් කල යුතුය. එවැනි ගණුදෙනු එම ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම් වලට අදාල සියලු තොරතුරු ලබාදෙන ආකාරයට මූල්‍ය ප්‍රකාශනවල අන් තැනක හෙළිදරව් කළ යුතුය. එසේ වුවද, 2021 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් සඳහා සැපයුම්කරුවන්ට ගෙවිය යුතු රු.17,555,328 ක වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් ඉවත් කර තිබුණද එය මූල්‍ය ප්‍රකාශනවල අන් තැනක හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02 හි 54 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කළ යුතු ගණුදෙණු, හෙළිදරව් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 48 ඡේදය පරිදි පූර්ව කාලපරිච්ඡේද වරදක්, පෙර කාලපරිච්ඡේදයට අදාළ නිශ්චිත බලපෑම් හෝ වරදෙහි සමුච්චිත බලපෑම නිගමනය කිරීම ප්‍රායෝගික නොවන්නේ නම් හැර, අතීතානුයෝගීව නැවත ප්‍රකාශ කිරීම මඟින් නිවැරදි කළ යුතු වුවද, එලෙස කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුල පෙර වර්ෂයේ ගැලපුම් ලෙස රු.15,288,355 ක් සමුච්චිත අරමුදලට ගැලපුම් කර තිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 48 ඡේදය ප්‍රකාරව පෙර කාලපරිච්ඡේදයන්ට අදාළ ගැලපීම් සිදුකිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | -එම- |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | --------------------- | ----------- |
| (අ) | ඉකුත් වර්ෂවල වැඩ අවසන් කර ඵලදායී ලෙස භාවිතයට ගනු ලැබූ රු.28,402,024 ක්වූ වත්කම් ප්‍රාග්ධනිත කිරීමකින් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ දක්වා තිබුණි. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.971,248 ක් සහ ඉකුත් වර්ෂ සඳහා ක්ෂය රු.3,083,782 ක් වශයෙන් ක්ෂය වීම් සඳහා ගැලපීම් කර නොතිබුණි. | ශේෂ පත්‍රයේ පසුගිය වර්ෂයට අදාළ මුළු වත්කම් හා මුළු වගකීම් එකතුව රු.6,064,171,771 ක් ලෙස සටහන් වී ඇත්තේ මුද්‍රණ දෝෂකින් බවත් එහි නිවැරදි අගය රු.5,530,582,524 ක් වන බවත් දන්වා සිටිමි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ගොඩනැගිලි ඉදිකිරීම සඳහා දරනු ලැබූ රු.15,751,930 ක වියදමට අදාල ව්‍යාපෘති නිශ්චිතව හඳුනාගෙන ප්‍රාග්ධනගත කිරීමට කටයුතු නොකර කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. | ඉදිරියේ දී මෙම වත්කම් නිවැරදිව හඳුනාගෙන ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | විධිමත් පරිදි ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගිවිසුම් අවලංගු කර ඉදිකිරීම් නවතා දමා තිබූ භාවිතයට ගැනීමට නොහැකි තත්වයේ පවතින රු.17,019,680 ක් වූ වත්කම් ප්‍රාග්ධනිත කර තිබූ අතර ඊට අදාල ක්ෂයවීම් රු.231,839 ක් ගැළපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි. | අතපසුවීමකින් රු.17,019,680 ක් වූ ගිවිසුම් අවලංගු කර ඉදිකිරීම් නවතා ඇති වත්කමක් ප්‍රාග්ධනිත කර ඇත. ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2022 වර්ෂයේදී ගෙවන ලද රු.19,575,119 ක වියදම්, උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් | උපචිත වියදම් යටතට ගැනෙන රු.19,575,119 ක සත්ව ආහාර වියදමින් රු.2,078.797 ක මුදලක් අතපසුවීමකින් ගිණුම් ගත | විධිමත් පරිදි ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | කිරීමට නොහැකි වී ඇති අතර ඉතිරි මුදල ගිණුම් ගත කිරීමට නොහැකි වී ඇත්තේ 2022 පෙබරවාරි 28 දිනට පෙර එම බිල්පත් සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් නොකිරීම මත බව දන්වා සිටිමි. | |
| (ඉ) | ආපනශාලා කුලී ආදායම් හඳුනාගැනීමේදී ගිවිසුමේ සඳහන් පරිදි ආදායම ගණනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආපනශාලා කුලී ආදායම සහ ලැබිය යුතු ආදායම රු.449,758 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම රු.449,758 ක මුදල වැඩියෙන් ගිණුම් ගත වී ඇති අතර මෙය ඉදිරි වර්ෂයේ ගිණුම පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ආදායම් නිවැරදිව ගණනය කළ යුතුය. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | |
| (අ) | දෙහිවල සත්වෝද්‍යානයේ ප්‍රධාන ආපනශාලාවේ 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු අදායම රු.10,777,115 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව එම ලැබිය යුතු ශේෂය (වැට් සහිත) රු.9,142,083 ක් විය. ඒ අනුව ලැබිය යුතු ආදායම රු.1,635,032 ක් වැඩියෙන් දක්වා තිබුණි. | **10,777,115** | **9,142,083** | **1,635,032** | ඉදිරි වර්ෂයේ ගිණුම පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අනුව භාණ්ඩාගාර තැන්පත් | 2,205,052,703 | 2,167,261,750 | 37,790,953 | අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අනුව භාණ්ඩාගාර තැන්පතු ගිණුමේ | විධිමත් පරිදි ගිණුම් තැබීමට කටයුතු |

| | | |
|---|---|---|
| ගිණුමේ ශේෂය භාණ්ඩාගාර සටහන් අනුව ශේෂය සමඟ සැසඳීමේදී රු.37,790,953 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර පෙර වර්ෂයේ පැවති වෙනස තවදුරටත් රු.4,560,927 කින් වැඩි වී තිබුණි. | | 2021.12.31 දිනට කළ යුතුය. ශේෂය භාණ්ඩාගාර සටහන් ශේෂය හා සැලකීමේ දී වෙනස ලෙස දක්වා ඇති රු.37,790,953 සඳහා තැන්පතු ගිණුමට කරන ලද හර කිරීම් හා බැර කිරීම් බලපා ඇති බව දන්වා සිටිමි. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019 සැප්තැම්බර් 09 දිනැති ලිපියේ පාස්කු ප්‍රහාරය හේතුවෙන් සත්වෝද්‍යානවල පවත්වාගෙන යනු ලබන වෙළඳසැල් 2019 අප්‍රේල් සිට ජූනි දක්වා වසා තබන ලද කාල සීමාවට අදාළව ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගන්නා බව දන්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එලෙස තීරණයක් ගෙන නොතිබුණි. මේ හේතුවෙන් රු.4,782,701 ක් වූ හිඟ බදු කුලිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම්තුමා දන්වන ලද පරිදි දෙපාර්තමේන්තු කමිටුවක් හරහා අයවිය යුතු මුදල තීරණය කර අනුමැතිය සඳහා මේ වන විට ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලද පසු අදාළ හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | හිඟ බදු කුලිය අය කර ගැනීම පිළිබඳ කඩිනමින් තීරණයක් ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 හා 4.2.3 ඡේද | ප්‍රසම්පාදනය ආරම්භ වීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කර ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කළ යුතු වුවද 2018/2019 හා 2020/2021 වර්ෂ සඳහා | ඉදිරි වර්ෂයට අදාළව ප්‍රසම්පාදන කාලසටහන පිළියෙල කිරීමේ දී ඖෂධ ප්‍රසම්පාදනය එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කර සකස් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඖෂධ මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී එවැනි කාලසටහනක් පිළියෙල කර නොතිබුණි. | | |
| (ආ) | ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 8.9.3 වගන්තිය | වටිනාකම රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ හා සේවා සඳහා විධිමත් ලිඛිත ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවද 2018/2019 වර්ෂ සඳහා රු.627,775 ක හා 2020/2021 වර්ෂ සඳහා රු.521,953 ක ඖෂධ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන වලදී අදාළ පෞද්ගලික සමාගම සමඟ විධිමත් ලිඛිත ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | ලිඛිත ගිවිසුමක් අත්සන් කිරීම අත්‍යාවශ්‍ය වන බැවින් ඒ සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කරන බව දන්වා සිටිමි. | -එම- |
| (ඇ) | ඖෂධ හා ඖෂධ උපකරණ පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:2:1 වගන්තිය | ඖෂධ හා උපකරණ මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සංයුතිය සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිතවරයෙකු, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ නියෝජිතවරයකු, විෂය ක්ෂේත්‍රය තුළ උපදේශකයින් අවම වශයෙන් දෙදෙනෙකු සහ භාණ්ඩාගාරයේ නියෝජිතයකු හෝ ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ නියෝජිතයකුගෙන් සමන්විත විය යුතු වුවද 2018/2019 වර්ෂ සඳහා ඖෂධ මිලදී ගැනීමේ තාක්ෂණික ඇගයීම් කමිටුවට සාමාජිකයින් තිදෙනෙකු පමණක් පත්කර තිබුණි. | ඉදිරි වර්ෂයේ සිට ඖෂධ හා ඖෂධ උපකරණ මිල දී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කරන බව දන්වා සිටිමි. | ඖෂධ හා ඖෂධ උපකරණ පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2019 ඔක්තෝම්බර් 29 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 270/2019 | එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී ඇති දෙපාර්තමේන්තුව විසින් යෙදවුම් හා නිමවුම් බදු CIGAS පද්ධතියෙහි | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙහි උපදෙස් මත සිගාස් පරිගණක පද්ධතිය මඟින් එකතු කළ අගය මත බදු පාලන ගිණුම ආරම්භ කර | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පිහිටවනු ලැබූ 9185 දරන පාලන ගිණුමක් ඔස්සේ හඳුනාගත යුතු වුවත්, වැට් බදු එකතු කිරීමේ නෛතික බලයක් නොමැති සත්වෝද්‍යාන සංවර්ධන අරමුදලෙහි ගිණුම් තුල රු.20,860,288 ක් වූ ලැබිය යුතු වැට් බදු ගිණුමක් පවත්වාගෙන ගොස් තිබුණි. | වර්ෂය අවසානයට ප්‍රථම බදු ගිණුම් ගත කිරීම සිඝ්‍රාස් පද්ධතිය මඟින් සිදුකිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.558,081,259 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.409,287,647 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.148,793,612 ක වර්ධනයක් නිරීක්ෂණය විය. කොවිඩ් 19 වසංගතය නිසා සමාලෝචිත වර්ෂයේ මාස කිහිපයක් සියලු සත්වෝද්‍යාන වසා තැබීම හේතුවෙන් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.92,364,343 කින් අඩු වී තිබීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 – 2022 වර්ෂය සඳහා පින්නවල අලි අනාථාගාරයට පළතුරු සැපයීමේ ගිවිසුම අනුව ඇඹුල් කෙසෙල්, කොමඩු හා අන්නාසි කිලෝ ග්‍රෑම් එකක සාමාන්‍ය මිලට වඩා වැඩි මිලගණන්වලට පලතුරු සපයා තිබුණු අතර පළතුරු සැපයුම් මිල හා වෙළඳපල අමිල සැසඳීමේදී කොන්ත්‍රාත් පිරිවැය රු.19,394,640 කින් වැඩි වී තිබුණි. සැපයුම් කොන්ත්‍රාත් කොන්දේසි මත පදනම්ව 2021 ඔක්තෝම්බර් 15 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා වෙළඳපල මිලට වඩා අධි මිලකට පළතුරු කිලෝ ග්‍රෑම් 44,513 ක් මිලදී ගෙන තිබුණු අතර ඒ හේතුවෙන් රු.3,724,156 ක අලාභයක් රජයට දැරීමට සිදු වී තිබුණි. | පළතුරු සැපයීමේදී ප්‍රසම්පාදන කමිටුව විසින් මිල ගණන් අඩු කර ගැනීම සඳහා සාකච්ඡා කර රු.5,952,420 ක මුදලක් අඩු කර ගැනීමට හැකි වූ බවත් ලංසුකරුවන් ඉදිරි වර්ෂයක කාලය සඳහා මිල ගණන් පුරෝකතනය කර මිල ගණන් ඉදිරිපත් කරන නිසා මෙම තත්ත්වය ඇති වී ඇති බවත් දන්වමි. | සත්ව ආහාර මිලදී ගැනීමේදී පිරිවැය අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙහිවල සත්වෝද්‍යානයට පලතුරු සැපයීමේ ගිවිසුම් කොන්දේසි පරිදි එකඟ වූ මිල ගණන් එම පලතුරු වල සාමාන්‍ය වෙළඳපල මිලට වඩා විශාල ලෙස වැඩි බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව වෙළඳපල මිල සමඟ සැසඳීමේදී රු.6,369,017 ක අධි මිලකට ගිවිසුම් ගත වී ඇති බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත් කොන්දේසි මත පදනම්ව වෙළඳපල මිලට වඩා වැඩි මිලට පළතුරු ලබා ගැනීම නිසා රු.1,725,261 ක අලාභයක් රජයට දැරීමට සිදු වී තිබුණි. | පළතුරු සැපයීමේදී ලංසුකරු සමඟ සාකච්ඡාකර මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 10 කින් පමණ අඩු කර ගැනීමට හැකි වූ බවත් ආනයනික පළතුරු සඳහා පනවන ලද බදු, වසංගත තත්ත්වය නිසා පළතුරු සොයා ගැනීමේ දුෂ්කරතාවය වැනි හේතු මිල ගණන් වැඩිවීමට බලපා ඇති බව දන්වමි. | -එම- |
| (ඇ) | රිදියගම සෆාරි උද්‍යානයේ රු.මිලියන 7.2 ක වියදමින් ඉදිකර තිබූ ග්‍රාමීය විකුණුම් මධ්‍යස්ථාන 12 ක් 2018 මාර්තු 22 වන දින වැඩ අවසන් කර තිබුණද 2022 අප්‍රේල් වන විටත් භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | මෙම ග්‍රාමීය අලෙවිසැල් බදු දීම සඳහා මේ වන විට ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි. | වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |
| (ඈ) | 2020 වර්ෂයේදී රු.මිලියන 66 ක වියදමකින් විදේශීය පක්ෂීන් 136 දෙනෙකු මිලදී ගෙන තිබුණු අතර මෙම පක්ෂීන් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉදිකිරීමට අපේක්ෂිත හම්බන්තොට සෆාරි උද්‍යානයේ පක්ෂි අරණෙහි ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණි. මේ හේතුවෙන් පක්ෂීන් 57 දෙනෙකු ප්‍රදර්ශනය කිරීමකින් තොරව සෆාරි උද්‍යානයේ වෙනත් කූඩුවල රඳවා තිබුණි. | මෙම විදේශීය පක්ෂි අරණ සඳහා යොදා ගත යුතු දැල් වර්ග ආනයනය කලයුතුය. එහෙත් රට තුල ඇති වී ඇති ඩොලර් අර්බුදය මත මෙම දැල් වර්ග ආනයනය කිරීමට නොහැකි වී ඇති අතර ඉදිරියේ මෙම තත්ත්වය සමනය වුවහොත් මෙම ඉදිකිරීම අවසන් කර ගත හැකි වන බව දන්වා සිටිමි. | සතුන් මිලදී ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමත් සමඟ සතුන් ප්‍රදර්ශනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වටිනාකම රු.82,334,768 වූ ව්‍යාපෘති තුනක දුර්වල කාර්යසාධනය හේතුවෙන් ගිවිසුම් අවලංගු කර තිබූ අතර එම ව්‍යාපෘති වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.26,942,651 වියදමක් දරා තිබුණි. | මේ වන විට ජාතික යන්ත්‍රෝපකරණ අධිකාරිය විසින් අත්හරින ලද ව්‍යාපෘතින් සිවිල් ආරක්ෂක බලකාය මඟින් එක් එක් ව්‍යාපෘතිය ලෙස ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ගත කාර්යයන් සම්පූර්ණ කළ යුතුය. |